# H U G O B O S S

## HUGO BOSS සැපයුම්කරුවන් සඳහා වූ චර්යාධර්ම සංග්‍රහය / HUGO BOSS සමාජීය සම්මතයන්

අප්‍රේල් 2020

## පෙරවදන

HUGO BOSS සැපයුම්කරුවන් සඳහා වූ චර්යාධර්ම සංග්‍රහය; ව්‍යාපාර ආචාරධර්ම, මානව අයිතිවාසිකම්, කම්කරු සහ සමාජීය සම්මතයන් මෙන්ම පාරිසරික සම්මතයන් පිළිපැදීම සහ අනුගමනයට අදාල මූලික ප්‍රමිතීන් ප්‍රකාශයට පත්කිරීම සඳහා සකසන ලද්දකි. මෙහි සඳහන් නියමයන් එක්සත් ජාතීන්ගේ (UN) මානව අයිතිවාසිකම් පිලිබඳ විශ්ව ප්‍රකාශය, එක්සත් ජාතීන්ගේ ව්‍යාපාර හා මානව අයිතිවාසිකම් පිලිබඳ මාර්ගෝපදේශන මූලධර්ම, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) මූලික සම්මුතීන් සහ ආර්ථික සහයෝගීතාව සහ සංවර්ධනය සඳහා වූ සංවිධානයේ (OECD) බහු ජාතික ව්‍යවසායන් සඳහා වූ මාර්ගෝපදේශන මූලධර්ම මත පදනම් වී ඇත. එසේම මේ සඳහා එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ දළ සම්මුතිය (UNFCCC) යටතේ එන දේශගුණික පැවැත්ම සඳහා විලාසිතා කර්මාන්ත ප්‍රඥප්තියේ සඳහන් මූලධර්මද සැලකිල්ලට ගෙන ඇත. මෙම විශේෂ නියමයන් මූලික අයිතිවාසිකම් සහ වගකීම් ලෙස HUGO BOSS ආයතනයේ සැපයුම්කරුවන් සහ ඔවුන්ගේ සේවකයන් විසින් සැලකිය යුතුය. HUGO BOSS ආයතනය විසින් සම්පාදනය කරන ලද නියමයන් මෙන්ම අදාල වන්නාවූ ජාතික නීතීන් හරහා පැන නඟින අයිතිවාසිකම් සහ වගකීම් පිළිබඳව තම සේවකයන් දැනුවත් කිරීමට සැපයුම්කරුවන් බැඳී සිටියි.

HUGO BOSS සැපයුම්කරුවන් සඳහා වූ චර්යාධර්ම සංග්‍රහය, HUGO BOSS සැපයුම්කරුවන් විසින් අනුගමනය කල යුතු සහ පිළිපැදිය යුතු අනුකූලතා ප්‍රමිතීන් වල පදනම වේ. HUGO BOSS විසින් නියම කර දක්වන ලද අවශ්‍යතා අවම ප්‍රමිතීන් වන අතර, ප්‍රසම්පාදන රටවල් තුල, HUGO BOSS ආයතනයේ දෘෂ්ඨිකෝනයෙන්, සෑහීමකට පත්විය නොහැකි නෛතික තත්වයන් මඟ හැරවීම එමගින් සිදුවේ. **යම් හෙයකින් රටක ව්‍යවස්ථාපිත නියෝගයන් සහ HUGO BOSS ආයතනයේ ප්‍රමිතීන් වල අභිප්‍රායන් සමාන වන්නේ නම්, සේවකයන්ගේ සහ පරිසරයේ යහපත වඩා සුරක්ෂිත කරන්නාවූ විධිවිධාන බලපවත්වන බව සැලකිය යුතුය.** නියමයන් නිරන්තර පරීක්ෂාවට ලක් කිරීමේ සහ පිළිපැදීම් සුදුසු ලෙස අනුවර්තනය කිරීමේ අයිතිය HUGO BOSS සතුය. එක් එක් අවස්ථාවන්හිදී පරීක්ෂාවන් සිදු කරන ආකාරය HUGO BOSS විසින් තෝරා ගනු ලබයි. යම් හෙයකින්, ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු සිදු කර නොමැති නම්, එක් එක් සිදුවීමේ සියලු තත්වයන් සහ උල්ලංඝනය කිරීමේ බරපතලකම සලකා බලා සම්බාධක පැනවීමේ අයිතිය HUGO BOSS සතුය. සියලුම නියමයන් ව්‍යාපාරික සම්බන්ධතාවයේ මූලික ගිවිසුම් සංරචක ලෙස සැලකිය යුතුය. නැවත නැවත

උල්ලංඝනයන් සිදු වුවහොත් ව්‍යාපාරික සම්බන්ධතාවය අවසන් කිරීමේ අයිතිය HUGO BOSS සතුය.

## 1. නීති සහ ව්‍යාපාර ආචාරධර්ම වලට අනුකූල වීම

HUGO BOSS තම සියලුම සැපයුම්කරුවන්ගෙන් අදාල ජාතික නීති සහ ජාත්‍යන්තරව එකඟ වී ඇති ප්‍රමිතීන්ට අනුකූල වීම අපේක්ෂා කරයි. සියලුම ආකාරයේ වංචා, දූෂණ සහ කුමන හෝ ආකාරයේ අසාධාරණ වාසි ලබාදීම සපුරා තහනම් වේ. තරඟකාරීත්වය, මුදල් විශුද්ධිකරණය, සම්බාධක සහ බදු අයකර ගැනීමට අදාල රෙගුලාසි වලට අනුකූල වීම මෙන්ම තම සැපයුම්කරුවන්ට බැඳී සිටීම යන කාරණා HUGO BOSS තම සියලුම සැපයුම්කරුවන්ගෙන් අපේක්ෂා කරයි. ව්‍යාපාරික තීරණ ගැනීම විෂයානුකූලව සිදුකල යුතු අතර ස්වාභිලාෂයන්ට යටපත් නොවිය යුතුය. තවද, තමන් භාරයට පත් කරන ලද තොරතුරු, දත්ත සහ වෙළඳ රහස් සුරැකීමට සියලුම අවස්ථාවන්වල සැපයුම්කරුවන් බැඳී සිටින අතර සැපයුම් සබඳතාව අවසන් වූ සැනින් එම තොරතුරු, දත්ත සහ වෙළඳ රහස් නැවත භාරදීම හෝ මකා දැමීම සිදුකල යුතුය.

## 2. මානව අයිතිවාසිකම් සහ කම්කරු ප්‍රමිතීන්

මානව අයිතිවාසිකම් සුරැකීම සහ මූලික නිදහස සුරැකීම HUGO BOSS හි පළමු ප්‍රමුඛතාවයයි. තම පාලනය යටතේ පවතින සියලු ව්‍යාපාර ක්‍රියාකාරකම් වලදී ජාත්‍යන්තරව පිළිගත් මානව අයිතිවාසිකම් වලට අනුකූලව කටයුතු කිරීම සියලු සැපයුම්කරුවන්ගෙන් අපේක්ෂා කෙරේ. HUGO BOSS කිසිදු උල්ලංඝනය කිරීමකට ඉඩ ලබා නොදෙයි. තම සේවකයන්ට උල්ලංඝනය වීම් වාර්තා කල හැකි නිර්නාමික පැමිණිලි යාන්ත්‍රණයක් සැකසීම සැපයුම්කරුගේ වගකීමක් වේ. තවද HUGO BOSS හි ස්වාධීන සහ ගාස්තු රහිත අනතුරු ඇඟවීමේ පද්ධතිය (whistleblower system) භාවිත කිරීමටද සැපයුම්කරුවන්ගේ සේවකයන්ට අවකාශ ඇත.

## ළමා ශ්‍රමය

HUGO BOSS සියලුම ආකාරයේ ළමා ශ්‍රමය තරයේ ප්‍රතික්ෂේප කරයි. එම නිසා සැපයුම්කරුවන් විසින් ළමා ශ්‍රමය යොදා ගැනීම සපුරා තහනම් වේ. ළමා ශ්‍රමය යන්නෙහි නිර්වචනය ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) ගෝලීයව පිළිගත් ප්‍රමිතීන් මත පදනම් වේ.රැකියාවකට බඳවා ගැනීමේ අවම වයස අවුරුදු 15 කි. ප්‍රතිපත්තියක් ලෙස, ව්‍යවස්ථානුකූලව අනිවාර්ය කරන ලද අධ්‍යාපනය අවසාන වන තුරු රැකියාවට බඳවා නොගත යුතුය. යම් හෙයකින් වයස 18ට පෙර රැකියාවට බඳවා ගනු ලද්දේ නම්, වයසින් අඩු සේවකයා සුරක්ෂිත කිරීම උදෙසා යම් අවශ්‍යතා සපුරාලිය යුතුය. මෙම කරුණු ජාත්‍යන්තර ප්‍රමිතීන් මත පදනම් වී ඇති අතර ළමා

ශ්‍රමය සහ බලහත්කාරයෙන් සේවයේ යෙදවීමට අනුරූප HUGO BOSS ප්‍රත්පත්තියේ සාරාංශ ගත කොට ඇත.

## බලහත්කාරයෙන් සේවයේ යෙදවීම සහ නූතන වහල් සේවය

HUGO BOSS හි සැපයුම්කරුවන් වෙනුවෙන් සේවය කරන සියළුම සේවකයින්ට තමන් සිදු කරන රැකියාවේ මාර්ග සහ විධි තෝරා ගැනීමටත්, ව්‍යවස්ථාපිත හා සුදුසු දැනුම් දීම් කාලයන්ට යටත්ව එය අවසන් කිරීමටත් නිදහස තිබිය යුතුය. බලහත්කාරයෙන් වැඩ කරන කම්කරුවන්, දාසයන්, වහලුන්, සිරකරුවන් හෝ වෙනත් යැපෙන සේවකයින් කිසිදු තත්වයක් යටතේ සේවයේ යොදවා නොගෙන නවීන වහල්භාවයට විරුද්ධ වන ලෙස සැපයුම්කරුවන්ට තරයේ අවවාද කර සිටියි. ව්‍යවස්ථාපිත දැනුම් දීම් කාලයන්ට යටත්ව සේවකයින්ට තම සේවා ස්ථානයෙන් ඉවත් වීමට සහ රැකියා සම්බන්ධතාවය අවසන් කිරීමට අයිතිය ලබා දිය යුතුය. සෑම විටම කම්කරුවන්ට නිදහසේ ඉවත්වීමට අවසර දිය යුතුය. සේවායෝජකයින්ට තැන්පතුවක් හෝ හඳුනාගැනීමේ ලේඛන හෝ ඒ හා සමාන රඳවා තබා ගැනීම් වලට අවසර නැත. යම් හෙයකින් සේවකයන් බඳවා ගැනීමේ කටයුතු සඳහා තෙවන පාර්ශවයක සේවය ලබා ගන්නේ නම්, ව්‍යවස්ථාපිත අවශ්‍යතා සහ HUGO BOSS විසින් දක්වා ඇති නියමයන්ට අනුකූලව කටයුතු සිදු කරන්නේද යන්න තහවුරු කිරීම සැපයුම්කරුගේ වගකීම වේ. තෙවන පාර්ශවයන්ගේ සේවය ලබා ගැනීම තුළින් පැන නගින කිසිදු පිරිවැයක් කුමන හේතුවක් මත හෝ සේවකයාට නොපැවරිය යුතුය.

## වෙනස් කොට සැලකීම

තෝරා ගැනීමේ ක්‍රියාවලියේදී සහ සමස්ත රැකියා සම්බන්ධතාවය පුරාම සියලුම සේවකයින්ට එක හා සමානව සැලකිය යුතු අතර සමාන අවස්ථා භුක්ති විඳීමට හැකි විය යුතුය. පෙළපත, සම්භවය, ජාතිකත්වය, සමේ වර්ණය, ස්ත්‍රී පුරුෂ භාවය, ආගම, දෘෂ්ඨිවාදය , සේවක සංගම්වල සාමාජිකත්වය, දේශපාලන මතය, ලිංගික දිශානතිය, වයස, විවාහක අවිවාහක බව, ගර්භණීභාවය, ආබාධිතභාවය, රෝගාබාධ හෝ වෙනත් පෞද්ගලික ගුණාංග මත පදනම්ව සිදු කෙරෙන ඕනෑම ආකාරයක වෙනස් කොට සැලකීම් වළක්වා ගත යුතුය.

## මානුෂීය සේවා තත්වයන්

සේවකයින්ගේ ගෞරවය, පෞද්ගලිකත්වය සහ පෞද්ගලික අයිතිවාසිකම් වලට සැමවිටම ගරු කළ යුතුය. ශාරීරික, මානසික, ලිංගික හෝ වාචික හිරිහැර මෙන්ම දඬුවම්, පහරදීම්, අපයෝජන හෝ බිය ගැන්වෙන ආකාරයේ හැසිරීම් සපුරා

තහනම්වේ. විනය ක්‍රියාමාර්ග සඳහා අවසර දී ඇත්තේ ව්‍යවස්ථාපිත විධිවිධාන හෝ HUGO BOSS විසින් නියම කර ඇති විධිවිධාන තුළ පමණක් වන අතර එය සෑම අවස්ථාවකදීම සිදුවීමේ ස්වභාවයට සමානුපාතික විය යුතුය.

## වේතන

මුදල් හෝ සේවකයාගේ අභිමතය පරිදි වෙනත් ආකාරයකින් හෝ අවම වශයෙන් මාසිකව නිසි පරිදි වේතන ගෙවීම සිදු කළ යුතුය. තවද, එකඟ වූ කොන්දේසි පිළිබඳව සේවා කොන්තරාත්තුවක් සහ වැටුප් පත්‍රිකාවක් ආකාරයෙන් සේවකයාට ලිඛිතව දැනුම් දිය යුතුය. කාර්ය සාධනය සඳහා සැපයුම්කරු විසින් ගෙවීම් සිදු කිරීමේදී සේවකයාගේ මූලික අවශ්‍යතා ආවරණය වන පරිදි සහ බෙදා හැරිය හැකි කොටසක් ඉතිරි වන පරිදි සිදු කල යුතුය. ව්‍යාපාර හවුල්කරුවන් අවම වශයෙන් ව්‍යවස්ථාපිත අවම ගෙවීමට හෝ ඊට වැඩි නම්, ක්ෂේත්‍රයේ සම්මතයට අනුරූප වේතනයක් ගෙවීමට බැඳී සිටියි. යම් හෙයකින් ක්ෂේත්‍රයේ සාමාන්‍යය වන ඉහළ වැටුපක් ගෙවීමට සැපයුම්කරුට නොහැකි නම් එය වහාම HUGO BOSS ආයතනයට දැනුම් දිය යුතු අතර එයට සාධාරණ හේතු ඉදිරිපත් කල යුතුය. HUGO BOSS සමඟ එක්ව වැටුප් මට්ටම් සංශෝධනය කරමින් කටයුතු කිරීමට සැපයුම්කරුගේ එකඟතාවයක් ඇතැයි යන්න අපේක්ෂා කෙරේ. තවද, සියළුම සැපයුම්කරුවන්ගෙන් සෞඛ්‍ය හා සමාජ සුභසාධන පද්ධති සඳහා වූ ජාතික රෙගුලාසි පිළිපැදීම සහ අනුකූල වීම බලාපොරොත්තු වේ.

ඊට අමතරව, විශේෂ ප්‍රතිලාභ වලට අදාලව සියලුම ව්‍යවස්ථාපිත සහ වෙනත් අදාළ නියමයන් (සාමූහික කේවල් කිරීමේ ගිවිසුම් වැනි) සලකා බැලිය යුතුය. අතිකාල දීමනාව වාරිකයක් ලෙස හෝ නීතියෙන් අවසර දී ඇති නම්, ඒ වෙනුවට නිවාඩු කාලයක් ලබාදීමෙන් හෝ ගෙවිය යුතුය. විනය ක්‍රියාමාර්ග ලෙස වැටුප් අඩුකිරීම් සැපයුම්කරුවන්ට සපුරා තහනම්වේ. යම් ලෙසකින් ජාතික ව්‍යවස්ථාපිත විධිවිධාන වලට අනුව, සේවකයෙක්ට විරුද්ධව පෙර අවස්ථාවක මූල්‍ය විනය ක්‍රියාමාර්ග ගනු ලැබ ඇති විට එම සේවකයා ස්වකැමැත්තෙන් තොරව රැකියාවෙන් පහකිරීමට ඉඩ ලබාදී ඇත්නම්, සත්‍ය කරුණු පමණක් සැලකිල්ලට ගනිමින් අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගත යුතුය. මෙම ක්‍රියාපටිපාටියේ පියවර ලේඛන ගත කිරීම සැපයුම්කරුගේ වගකීම වේ.

## සේවා කාලය

විවේක කාලය, රජයේ නිවාඩු සහ නිවාඩු පිළිබඳ රෙගුලාසි ඇතුළුව සේවා කාලය පිළිබඳ අදාළ ජාතික විධිවිධානවලට අනුකූල විය යුතුය. ජාතික විධිවිධාන නොමැති නම්, හෝ ඒවා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) විධිවිධානවලට වඩා අඩු නම්, සතියක නියත සේවා කාලය පැය 48 නොඉක්මවිය යුතුය. අවසරලත් අතිකාල

ඇතුළත්ව, සතියක මුළු සේවා කාලය පැය 60 නොඉක්මවිය යුතුය. අතිකාල සේවයේ යෙදවීමට අවසර ඇත්තේ එය ස්වේච්ඡාවෙන් සිදු කරන්නේ නම් හෝ අතිකාල සේවය නීතිය මගින් හෝ අදාළ සාමූහික ගිවිසුම් (සාමූහික කේවල් කිරීමේ ගිවිසුම් වැනි) මගින් නියාමනය කරනු ලැබුවහොත් පමණක් වන අතර ඒ සඳහා නියමිත පරිදි ගෙවීම් සිදු කල යුතුය. අනුක්‍රමික වැඩ කරන දින හයකට පසු, සේවකයාට අවම වශයෙන් පැය 24 ක විවේක කාලයක් ලබා දිය යුතුය. තවද, සෑම සේවකයෙකුටම ව්‍යවස්ථාපිත අවම නිවාඩු ලබා ගැනීමේ හිමිකමක් ඇත.

## වෘත්තීය සෞඛ්‍යය සහ ආරක්ෂාව

සැපයුම්කරු විසින් තම සේවකයින්ගේ සේවා කාර්යයන් අතරතුර ඔවුන්ගේ සෞඛ්‍යය හා ආරක්ෂාව සහතික කළ යුතු අතර, අනතුරු සහ සේවා ස්ථානය නිසා ඇතිවිය හැකි රෝගාබාධවලට එරෙහිව සුදුසු පූර්වාරක්ෂක ක්‍රියාමාර්ග ගත යුතුය. සේවකයින්ගේ සෞඛ්‍යයට හා ආරක්ෂාවට ඇති විය හැකි අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම, වළක්වා ගැනීම සහ ඒවාට එරෙහිව සටන් කිරීම සඳහා වන ක්‍රමවේදයන් සලසා ඇති බවට සැපයුම්කරු විසින් සහතික කර ගත යුතුය. ජාතික පිරිවිතරයන්ට අනුකූල විය යුතු අතර දීර්ඝ කාලීන පැවැත්ම සහතික කල යුතුය. ආරක්ෂිත හා සනීපාරක්ෂිත සේවා පරිසරයක් සහතික කිරීම සඳහා මෙම පිරිවිතරයන් ප්‍රමාණවත් නොවන බව HUGO BOSS සලකන්නේ නම්, ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන්ට අනුරූපව තමන්ගේම පිරිවිතරයන් ප්‍රකාශ කිරීමේ අයිතිය හියුගෝ බොස් සතුය. මෙහි විශේෂයෙන් සඳහන් කර ඇති අවශ්‍යතා සැපයුම්කරු විසින් සේවකයින්ට ලබා දෙන නවාතැන් වැනි අමතර පහසුකම් සඳහා ද අදාල වේ.

## ඒකරාශි වීමේ නිදහස සහ සාමූහික කේවල් කිරීම

සේවක අරමුණු සඳහා තමන් කැමති සංවිධාන පිහිටුවීමට හෝ සේවක සංවිධානවලට බැඳීමට සියලුම සේවකයින්ට අයිතිය ලබා දෙන ලෙස සැපයුම්කරුවන්ගෙන් ඉල්ලා සිටියි. විශේෂයෙන් සේවා තත්වයන් සහ වැටුප් පිළිබඳ සාකච්ඡා කිරීමට සහ ඒ සම්බන්ධව පවතින බාධක ඉවත් කරගැනීමට සේවකයින්ට නිදහස තිබිය යුතුය. මෙම අයිතීන් වෙනුවෙන් පෙනීසිටින සේවකයින්ට වෙනස් කොට සැලකීම, හිරිහැර කිරීම, බිය ගැන්වීම, අවවාද කිරීම  හෝ වෙනත් ආකාරයකින් අවාසි සිදු කිරීම නොකළ යුතුය.

## 3. පාරිසරික කරුණු

HUGO BOSS සිය සැපයුම්කරුවන්ගෙන් ඉල්ලා සිටින්නේ ඔවුන්ගේ ව්‍යාපාරික ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන පාරිසරික බලපෑම් අවම කිරීම සඳහා අඛණ්ඩව කටයුතු කරන ලෙසයි. අවම වශයෙන් නිෂ්පාදන සිදු කරන රටට අදාළ පාරිසරික ආරක්ෂණ නීති සහ විධිවිධානවලට අනුකූල විය යුතුය. ස්වාභාවික සම්පත් හැකි තරම් තිරසාර ලෙස හා කාර්යක්ෂමව ආරක්ෂා කළ යුතුය. එසේ කිරීමෙන් මිනිසුන් සහ පරිසරය ආරක්ෂා කිරීම ඉතා වැදගත් වේ. සැපයුම්කරුවන් විසින් නිශ්චිත අරමුණු තුළින් පාරිසරික වගකීම වැඩි කිරීමට දායක වන පාරිසරික කළමනාකරණ පද්ධතියක් සකස්කිරීම අවශ්‍යතාවයක් ලෙස සැලකේ.

## බලශක්ති පරිභෝජනය සහ හරිතාගාර වායු විමෝචනය

සැපයුම්කරුවන් විසින් අදාළ සියලු බලශක්ති ප්‍රභවයන් සහ හරිතාගාර වායු විමෝචනයන් හඳුනාගැනීම සහ අධීක්ෂණය කිරීම අවශ්‍යතාවයක් ලෙස සැලකේ. බලශක්ති පරිභෝජනය හා විමෝචනය අවම කිරීම සඳහා වැඩපිළිවෙළක් සැකසීමට සැපයුම්කරුවන් උත්සාහ කළ යුතුය. බලශක්ති කාර්යක්ෂමතා වැඩ පිළිවෙලවල් සහ පුනර්ජනනීය බලශක්ති අඛණ්ඩව සොයා යාමට සිය සැපයුම්කරුවන් කැපවනු ඇතැයි HUGO BOSS අපේක්ෂා කරයි.

## ජල පරිභෝජනය

සැපයුම්කරුවන් ඔවුන්ගේ ජල පරිභෝජනය අධීක්ෂණය කර සුදුසු උපාය මාර්ග ක්‍රියාවට නැංවීමෙන් එයින් උපරිම ඵල ලබා ගත යුතුය. මතුපිට හෝ භූගත ජලය ලබා ගැනීම අවම වශයෙන් ජාතික හෝ ප්‍රාදේශීය නියමයන්ට අනුරූප විය යුතුය.අධික ජල පරිභෝජනයක් ඇති නිෂ්පාදන ක්‍රියාවලීන් සහිත සැපයුම්කරුවන්ගෙන් විශේෂයෙන් ඉල්ලා සිටින්නේ අඛණ්ඩව තම ජල භාවිතය අවම වන ලෙස කටයුතු කරන ලෙසයි.

## රසායනික හා අපජල කළමනාකරණය

නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා මිනිසුන්ට හෝ පරිසරයට තර්ජනයක් වන රසායනික ද්‍රව්‍ය හෝ වෙනත් ද්‍රව්‍ය භාවිතා කිරීම අවශ්‍ය වන්නේ නම්, අනතුරුදායක ද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක ආධාරයෙන් ඒවා භාවිතා කරන ආකාරය සහ හැසිරවීම, ගබඩා කිරීම සහ ප්‍රවාහනය නියාමනය කිරීමට සැපයුම්කරුවන් ක්‍රියාකල යුතුය. ජාතික විධිවිධාන වලට අනුකූල විය යුතුය. පරිසරයට හා සෞඛ්‍යයට හානිකර නොවන විකල්ප ද්‍රව්‍ය තිබේ නම්, ඒවා භාවිතා කිරීමට සැපයුම්කරුවන් උනන්දු විය යුතුය. රසායනික ද්‍රව්‍ය හා වෙනත් ද්‍රව්‍ය භාවිතා කරන විට, අපජල ප්‍රවාහයන් අධීක්ෂණය කිරීමට සහ සිදුවිය හැකි අපවිත්‍රවීම් හඳුනා ගැනීමට සැපයුම්කරුවන්

කැපවිය යුතුයි. මෙය ව්‍යවස්ථාපිත නියමයන්ට අනුකූලව සිදු කළ යුතුය. නිරතුරුව නිසි කාලපරිච්ඡේදයකට වරක් පරීක්ෂාවන් සිදු කළ යුතුය.

## අපද්‍රව්‍ය කළමනාකරණය

අපද්‍රව්‍ය නිපදවීම අඛණ්ඩව අවම කරන ලෙස සහ එම අපද්‍රව්‍ය දේශීය ව්‍යවස්ථාපිත නියමයන් අනුව බැහැර කරන ලෙස HUGO BOSS සිය සැපයුම්කරුවන්ගෙන් ඉල්ලා සිටියි. අපද්‍රව්‍ය නිපදවීම වළක්වා ගැනීම හෝ අඩු කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය සඳහා උපාය මාර්ග සලකා බැලීම සැපයුම්කරුවන්ගෙන් අපේක්ෂා කෙරේ.

## වෙනත් පාරිසරික කරුණු

ඉහත ලැයිස්තුගත කර ඇති පාරිසරික කරුණු වලට අමතරව, සැපයුම්කරු සිටින ස්ථානය සහ නිශ්චිත නිෂ්පාදන ක්‍රියාවලීන්ට අදාලව වායු විමෝචනය, භූමි පරිහරණ කළමනාකරණය, ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම, ශබ්දය, ගන්ධ විමෝචනය සහ වෙනත් පාරිසරික අංශ සඳහා ජාතික හෝ ප්‍රාදේශීය නියමයන් අදාළ විය හැකිය.

## 4. රාජ්‍ය නොවන සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම

හවුල්කරුවන් සමඟ ඇති සහයෝගීතාවයට අදාළ සමාජ තත්වයන් සහ පාරිසරික ගැටළු යහපත් තත්වයට පත් කිරීම සඳහා, HUGO BOSS විවිධ රාජ්‍ය නොවන සංවිධාන සමඟ කටයුතු කරයි. එවැනි හවුල්කාරිත්වයේ කොටසක් ලෙස, ආරම්භයේදී එකඟවූ පරිදි සත්‍යාපන (විගණන වැනි) කටයුතු සිදු කිරීමේ බලය මෙම හවුල්කාර සංවිධාන වෙත පැවරීමේ අයිතිය HUGO BOSS සතුය.

## 5. අවසාන විධිවිධාන

HUGO BOSS තමන් විසින්ද අනුගමනය කරන, මෙහි දක්වා ඇති ප්‍රමිතීන්ට තම සැපයුම්කරුවන් අනුකූල වනු ඇතැයි අපේක්ෂා කරන අතර කළමනාකරණ පද්ධති, මාර්ගෝපදේශන සහ ක්‍රියාවලියන්ට අදාළ උපදේශනයන් වැනි සුදුසු ආධාරක මඟින් ඒවා ක්‍රියාත්මක කිරීම දිරිමත් කරන ලෙස තම හවුල්කරුවන්ගෙන් ඉල්ලා සිටී. මෙහි සාකච්ඡා කර ඇති ගැටළු පිළිබඳව ප්‍රමාණවත් හා විධිමත් පුහුණුවක් සැපයුම්කරුවන් විසින් සියලු සේවකයන්ට ලබා දිය යුතුය. තවද, සැපයුම්කරුවන් විසින් මෙම පිරිවිතරයන් ඔවුන්ගේ ප්‍රධාන පෙලේ සැපයුම්කරුවන්ට සහ හවුල්කරුවන්ට ලබා දීමට බැඳී සිටින අතර ඔවුන් නිසි පරිදි ඒවාට අනුකූලව කටයුතු කරන්නේද යන්න තහවුරු කර ගැනීමට බැඳී සිටියි. සැපයුම්කරුගේ චර්යාධර්ම පද්ධතිය යාවත්කාලීනව පවතින්නේද යන්න නිරතුරුව හෝ අවම වශයෙන් වාර්ෂිකව තහවුරු කර ගැනීමේ,

අදාළ අවස්ථාවන්හිදී එය සංශෝධනය කිරීමේ සහ වෙනස්කම් සැපයුම්කරුවන්ට සන්නිවේදනය කිරීමේ අයිතිය HUGO BOSS සතුය.

මෙය ඉංග්‍රීසියෙන් ලියා ඇති මුල් කොන්ත්‍රාත්තුවේ සිංහල පරිවර්තනයකි.

යම් හෙයකින් පිටපත් දෙක අතර කිසියම් ප්‍රතිවිරෝධතාවයක් පැවතුනහොත්, ඉංග්‍රීසි පිටපත බලපවත්වනු ඇත.